සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

21 S I

9 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 02 දක්වා දී ඇති රූඩීවලින් ප්‍රකාශ වන අර්ථ තෝරා ඉරි අඳින්න.**

01 උපාසක බළලා,

(i) සුදන වෙස් ගත් දුදනා (ii) දුදන වෙස් ගත් සුඳනා

(iii) සුදන වෙස් ගත් උපාසකයා (iv) උපාසක හා බළල් වෙස් ගත් දුදනා

02 දිවෙන් දිව ගාගෙන,

(i) දිවට දිව තියා බැඳගෙන

(ii) දූඩි මිතුරන් සේ හැසිරීම

(iii) දූඩි මිතුරු දමින් බැඳී සිටීම

(iv) දිවෙන් මිතුරන් හඳුනා ගැනීම

03 ''කෙනෙකුගෙන් ලාභ ප්‍රයෝජන ලබමින් සිට ඔහුට විපතක් සිදු කිරීම'' මේ අදහසට වඩාත් යෝග්‍ය ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(i) ගලෙන් පට්ටයක් ගන්නවා වගේ. (ii) අගේ ඉඳන් කන කනවා වගේ.

(iii) අතු කඩා මොර කනවා වගේ. (iv) කටුස්සාගේ කරේ රන් බැන්දා වගේ.

04 පහත දැක්වෙන වචන ආකාරාදියට සකස් කළ විට නිවැරදි විය යුතු ආකාරය තෝරන්න.

(i) සුසංවර, සුන්දර, සුභාවිත, සුයාමය, සුලලිත

(ii) සුභාවිත, සුලලිත, සුසංවර, සුන්දර, සුයාමය

(iii) සුන්දර, සුභාවිත, සුලලිත, සුයාමය, සුසංවර

(iv) සුන්දර, සුභාවිත, සුයාමය, සුලලිත, සුසංවර

05 'ඡ, ඬ', 'ට, ඨ' මෙම අක්ෂරවල උත්පත්ති ස්ථාන පිළිවෙලින්,

(i) කණ්ඨජ හා තාලුජ යි. (ii) තාලුජ හා මූර්ධජ යි.

(iii) දන්තජ හා තාලුජ යි. (iv) ඕෂ්ඨජ හා මූර්ධජ යි.

06 'ඌ' යන ස්වරයට පසුව හා 'ල' යන ව්‍යඤ්ජනයට පසුව යෙදෙන අක්ෂර වන්නේ,

(i) 'ෲ' සහ 'ව' අක්ෂර ය. (ii) 'එ' සහ 'ර' අක්ෂර ය.

(iii) 'උ' සහ 'ය' අක්ෂර ය. (iv) 'ඔ' සහ 'ශ' අක්ෂර ය.

07 එකිනෙකට සමාන අර්ථ යෙදුණු යුගල පදය වන්නේ මින් කුමක් ද?

(i) නඩු හබ (ii) අඟුර දඟර (iii) ඔප්පු තිරප්පු (iv) යාම් ඊම්

08 'විශාල' යන පදයට සමාන පදයක් නොවන පදය තෝරන්න.

(i) පෘථුල (ii) තුමුල (iii) පතළ (iv) විසල්

09 පහත දැක්වෙන් පද අතරෙන් උපසර්ග නාම පදය තෝරන්න.

(i) දුසිරිත් (ii) දුරේක්ෂය (iii) දුම්දූ (iv) දුක්ඛිත

10 අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) සමස්ථ, විශ්වය, විස්මය (ii) නිෂ්ඵල, න්‍යෂ්ඨික, ආභාසය

(iii) පිළිවෙළ, විනිශ්චය, වීරෝධාර (iv) මාර්ගස්ථ, විස්තරය, ප්‍රස්තාර

11 විරාම ලක්ෂණවලින් ඇල ඉර (/) යෙදෙන අවස්ථාවක් වන්නේ මින් කුමක් ද?

(i) ශෝකයක් හඟවන ප්‍රකාශනයක දී. (ii) අමතර තොරතුරක් දැක්වීමේ දී.

(iii) යම් ප්‍රකාශයක් කෙටි කිරීමේ දී. (iv) විකල්ප ව්‍යවහාර දැක්වීමක දී.

12 'දරුවන්ගේ භාෂා ඥානය හා වාක්කෝෂය පුළුල් කිරීම ද ළමා සාහිත්‍යයෙන් අපේක්ෂිත ය.'' මෙම වාක්‍යයේ යෙදී ඇති විශේෂණ පද දෙකක් වන්නේ,

(i) වාක්කෝෂය හා අපේක්ෂිත (ii) භාෂා හා පුළුල්

(iii) භාෂා හා ළමා (iv) ඥානය හා ළමා

13 පහත දී ඇති පද අතරෙන් සචේතන උක්ත නාම පදයක් හා සචේතන අනියමාර්ථ උක්ත නාම පදයක් උපුටා ලියන්න.

(විද්වත්තු / පර්වත / නීතිඥයෙක් / දැරියක / ඡායාරූපය)

(අ) ............................................................ (ආ) ............................................................

14 පහත දැක්වෙන වාක්‍ය අතරෙන් නිවැරදි වාක්‍ය තෝරන්න.

(i) අලි රංචුව ගමට පහර දෙයි. (ii) සමහරු ජීවිතය බේරා ගනිති.

(iii) ගංගාවෝ හඬ නොනගා ගලයි. (iv) ගස් පෙළ ඉදිරි වැටෙත්.

15 ''ඔවුහු මා හඳුනා ගත්හ'' මෙම වාක්‍යය කර්ම කාරකයට හැර වූ පසු පැවතිය යුතු නිවැරදි ස්වරූපය වනුයේ,

(i) ඔවුහු විසින් මම හඳුනා ගනු ලැබීමි. (ii) ඔවුන් විසින් මම හඳුනා ගනු ලැබීමි.

(iii) ඔවුන් විසින් මා හඳුනා ගනු ලැබීමි. (iv) මා ඔවුන් විසින් හඳුනා ගනු ලැබීමි.

16 ''හිස් රැවුල් කපන්නා', 'සතුන් බලා ගන්නා තැනැත්තා' මේ අදහස්වලට යෙදෙන තනි පද පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) එඬේරා හා ගොපල්ලා (ii) ගොපල්ලා හා කරණවෑමියා

(iii) කරණවෑමියා හා එඬේරා (iv) කරණවෑමියා හා ගොපල්ලා

17 'මුව' යන පදයට බහු අර්ථ පදයක් නොවන්නේ කුමන පදය ද?

(i) මුහළ (ii) මුඛය (iii) මුහුණ (iv) මුවා

18 'වපුරයි' යන ක්‍රියා පදයේ අතීත කාල ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා පදය වන්නේ,

(i) වැපුරුවේය. (ii) වැපුරූහ. (iii) වැපුරුවෙහු. (iv) වැපිරිණි.

19 ධීවර භාෂාවේ 'ඉයත්තුව' යනුවෙන් හඳුන් වන්නේ,

(i) මුහුදු රළ යි. (ii) ඉදල යි. (iii) කාලගුණය යි. (iv) එළිපත්ත යි.

20 පහත දැක්වෙන පද්‍යයේ හිස්තැනට ගැළපෙන කවි පදය තෝරා ලියන්න.

මල්වල සුමිහිරි පැණි
....................................................
හොඳ ළමයා නුවණිනී
හොඳ දේ තෝරා ගනී

(i) ඇද බොන බඹරුන් මෙනී (ii) රස කර බොනවා මෙනී

(iii) බොන සමනලයෙකු මෙනී (iv) ඇද බොන බඹරා මෙනී

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **ප්‍රශ්න අංක 01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''ඔවා දෙනු පරහට - තමා සම්මතයෙහි පිහිටා සිට''
   (අ) මෙම පද්‍ය පාදය අයත් මුල් කෘතිය කුමක් ද?
   (ආ) මෙම කියමන කුමන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයකට අයත් වන්නේ ද?

(ii) පහත සඳහන් ග්‍රන්ථ රචනා කළ කතුවරුන් නම් කරන්න.
   (අ) කියවන නුවණ
   (ආ) ළදරු ගී

(iii) (අ) ''දෑසේ නිල් පැහැය'' පද්‍ය නිර්මාණය උපුටා ගෙන ඇති කාව්‍ය සංග්‍රහය කුමක් ද?
   (ආ) එම කාව්‍ය සංග්‍රහයේ රචකයා නම් කරන්න.

(iv) (අ) කුමාරතුංග මුනිදාස මහතා විසින් රචිත ප්‍රබන්ධ කෘති දෙකක් ලියන්න.
   (ආ) ප්‍රබන්ධකරණයට මඟ පෙන්වීමේ අරමුණින් එතුමා ලියන ලද කෘතියක් නම් කරන්න.

(v) සද්ධර්මරත්නාවලිය ලියූ,
   (අ) කතුවරයා
   (ආ) සාහිත්‍ය යුගය නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

02 පහත සඳහන් මග පෙන්වන ලද ඡේදය අතුරින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

(i) ගස් නැවත වැවෙන වේගයට වඩා වැඩි වේගයෙන් කපා දැමීම සිදුවේ. පිරිසිදු වාතය නොමැතිවීම, වර්ෂාපතනය අඩුවීම මෙන් ම නායයාම් වැනි ස්වාභාවික ආපදා තත්ත්වයන්ට මිනිසාට මුහුණ දීමට සිදුව ඇත්තේ මිනිසා විසින් ම සිදු කරන වනාන්තර විනාශයේ ප්‍රතිඵලයක් ලෙසිනි. මෙම කරුණු සැලකිල්ලට ගෙන 'වන විනාශය වළකමු. පරිසරය සුරකිමු' යන මාතෘකව යටතේ රචනයක් ලියන්න.

(ii) ලෝකයේ බොහෝ රටවල මේ වන විට යුද ගැටුම් හටගෙන තිබේ. මෙයින් බාල, මහලු, තරුණ භේදයකින් තොර ව බොහෝ පිරිස් මරණට පත් වෙති. බොහෝ වස්තුව ද විනාශ වෙයි. මේ තත්ත්වය මඟහරවා ගැනීමට නම් ළමා කල සිට ම සාමකාමී බවේ අගය සෑම රටක් ම තම දරුවන්ට කියා දිය යුතුය. මේ කරුණු පදනම් කරගෙන 'සාමයේ අගය' යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(iii) ගං ඉවුර වසා සිටි විශාල කුඹුක් ගස් සිසිල් සෙවණේ ගලා යන දිය දහරාව තවතවත් සීතල කරවයි. ගඟ දෙපස පිහිටි නොයෙක් හැඩතල ගත් ගල් කුළු ගඟ දෙස බලා සිටී. සැඳෑ අඳුරත් සමග හමා එන සිසිල් සුළඟ මගේ ගත සිත සුවපත් කරයි. සිහින් ගීත හඬින් ගලා බසින ගඟ අසබඩ තුරුලතා අතුපතර සැරිසරන කුරුලු කොබෙයියෝ තුති ගී ගයන්නේ ගංදෑලේ සුන්දරත්වය විඳිමිනි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් 'ගංගාවක් අසබඩ ගත කළ සැන්දෑවක්' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(iv) මාර්ග නීති උල්ලංඝනය කරමින් අධික වේගයෙන් වාහන ධාවනය කිරීම නිසා සිදු වන රිය අනතුරු පිළිබඳ මේ දිනවල සමාජයේ වැඩි කතා බහට ලක්ව ඇත. මේ හේතුවෙන් දිනකට මිනිස් ජීවිත ගණනාවක් අපට අහිමි වෙමින් පවතින බැවින් මාර්ග අනතුරු අවම කර ගැනීම කෙරෙහි අප සැමගේ අවධානය යොමු විය යුතු ය. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් මාර්ග ''මාර්ග නීති පිළිපදිමු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 20)

03 පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''මා එය දන ගෙන එන තුරු සතුටින් සිටිනු මැනවි''
   (අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින් ද? කාහට ද?
   (ආ) මෙම ප්‍රකාශය අනුව දන ගැනීමට අවශ්‍ය වූයේ කුමක් ද?

(ii) ''සමනොළ කන්දේ උඩවැඩියා මල - සීතලයෙන් පිපිරේ
මිහින්තලා ගල මලින් පිරීලා - සේදේ සිල් මිහිරේ''
   (අ) මෙම ගීතයේ රචකයා නම් කරන්න.
   (ආ) මිහින්තලයේ පූජනීයත්වය පැවසීමට යොදා ගෙන ඇති ව්‍යංගාර්ථවත් යෙදුම කුමක් ද?

(iii) ''ඉදින් මු තුමු පළමු වයස දී වස්තුව නො නසා කෘෂි වණික් ආදී කටයුත්තෙක යෙදූ නම් මෙම නුවර නායක සිටු තනතුර ලැබෙති.''

(අ) බුදු රජාණන් වහන්සේ විසින් මෙම ප්‍රකාශය කරන ලද අවස්ථාව කුමක් ද?

(ආ) සිටු තනතුර නොලැබීමට හේතුව ලියන්න.

(iv) පහත සඳහන් පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ගසක දොඩම් මදෙයි කියා කෑ දූයි අපෙ අම්මා
අහස තරුත් මදෙයි සිතා විලි ලූ දූයි අම්මා
.......................................................................................
.......................................................................................

(v) ''ජීවිතයේ <u>අනපේක්ෂිත</u> බිඳ වැටීම් සමූහයක් හමුවේ <u>අකම්පිතව</u> ඊට මුහුණ දී ලොව දස දිගෙහි ජය දද නැංවූ විද්වතකු ලෙස කීර්තියක් අත්කර ගැනීමට සමත් වූ මේ අසහාය මිනිසාගේ ජීවිතය සියලු දෙනාට ම මහත් ආදර්ශයකි.''

(අ) මෙහි සඳහන් අසහාය මිනිසා කවරෙක් ද?

(ආ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

04 බලගල ගමේ තරුණ සමිතිය මගින් ''ගී රස වින්දන'' වැඩසටහනක් 2025.10.05 දින ''සඳරු'' ප්‍රජාශාලාවේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් බලගල ප්‍රාදේශීය ලේකම්තුමාට ආරාධනා කිරීමට තීරණය කර ඇත. මේ සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (තරුණ සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.)

(ලකුණු 10)

**05** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපි එදිනෙදා ජීවිතයේ දී කෙටිකතා, නවකතා, කවි කියවා ඇත්තෙමු. ඒවා කියවා රස විඳින කාව්‍ය ගණයට අයත් වෙයි. නාට්‍ය, ටෙලිනාට්‍ය, චිත්‍රපට ආදිය නරඹා රස විඳිය යුතු ඒවා ය. ඒවා දෘශ්‍ය කාව්‍ය ලෙස සැලකේ. ඒවායින් උපරිම වින්දනයක් ලැබෙන්නේ වේදිකාවක රඟ දක්වනු නරඹන විට ය. නාට්‍යයක් ඉදිරිපත් කෙරෙන්නේ වර්තමාන ස්වරූපයෙනි. නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයා නාට්‍යයේ සිදුවීම් මාලාව තමා ඉදිරියේ එවලේ ම සිදු වන්නක් ලෙස දකියි. කතාන්දරයක් කියවන පාඨකයා හෝ අසන ශ්‍රාවකයා හෝ එහි සිද්ධි හා අවස්ථා තම සිතෙහි චිත්ත රූප මවමින් පරිකල්පනය කළ යුතු ය.

(i) කියවා රසවිඳින කාව්‍ය ගණයට අයත් වන්නේ මොනවා ද?

(ii) දෘශ්‍ය කාව්‍යයෙන් උපරිම වින්දනයක් ලැබෙන්නේ කුමන අවස්ථාවේදී ද?

(iii) නාට්‍යයක් ඉදිරිපත් කරන්නේ කුමන ස්වරූපයෙන් ද?

(iv) තම සිතෙහි චිත්ත රූප මවමින් රසවිඳින්නේ කවුද?

(v) පහත අදහස් සඳහා තනි පද ඡේදයෙන් සොයා ලියන්න.

(අ) අලුතින් යමක් සිතීම - ........................................

(ආ) නාට්‍ය නරඹා රසවිඳින්නා - ........................................

(ලකුණු 2 x 5 = 10)

06 අර්ථ දෙකක් ලෙස දී ඇති පහත දැක්වෙන වාක්‍ය දෙක තනි වාක්‍යයක් ලෙස ගළපා ලියන්න.

(i)
- අම්මා වෙළෙඳ පොළට යයි.
- අම්මා විශාල ගුවන් යානාවක් දකියි.

(ii)
- මිනිස් සිතුවිලි ඉතාමත් ම මෘදු ය.
- දරුණු සත්තු ද දමනයට පත් වෙති.

(iii)
- ජනප්‍රිය ගායිකාව වේග රිද්ම ගීතයක් ගැයුවා ය.
- ඇය වේදිකාවෙන් බැස ගියා ය.

(iv)
- පොලිස් නිලධාරියා මට අවවාද කරයි.
- පොලිස් නිලධාරියා මා දෙස බලයි.

(v)
- රාජ්‍ය නායකයා උත්සව සභාව ඇමතීමට සූදානම් ය.
- ශාලාවේ සිටි සියල්ලෝ ම නිශ්ශබ්ද වූහ.

(ලකුණු 2 x 5 = 10)